**රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත ආයතන, රජය සතු බැංකු සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල නිලධරයන් සඳහා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා දිරිදීමනා ගෙවීම**

**රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව**

**රාජ්‍ය භාෂා ප්‍රවීණතා වාචික පරීක්ෂණය**

**සිංහල/ දෙමළ I, II, III, IV මට්ටම**

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් 2023.01.19 දිනැතිව නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2023හි 8.1 ඡේදය ප්‍රකාරව කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 4/2014 විධිවිධාන අනුව **රාජ්‍ය** සංස්ථා ව්‍යවස්ථාපිත ආයතන, රජය සතු බැංකු සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල නිලධරයන් සඳහා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා දිරිදීමනා ගෙවීමට අදාළව තම අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කර ගැනීම සඳහා පහත සඳහන් ලිඛිත සුදුසුකම්වලින් එකක් සපුරා ඇති නිලධාරීන්ට වාචික පරීක්ෂණයට පෙනී සිටීම සඳහා එක් අවස්ථාවක් ලබා දීමට කටයුතු සම්පාදනය කර ඇත.

I. රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත විභාගය සමත් වීම හෝ
II. අ. පො. ස. (සා. පෙළ) විභාගයේ සිංහල / දෙමළ භාෂාව හා සාහිත්‍ය විෂය සමත් වීම හෝ
III. අ. පො. ස. (සා. පෙළ) විභාගයේ සිංහල / දෙමළ දෙවන බස සමත් වීම

02. ඒ අනුව මේ වන විට අදාළ ලිඛිත සුදුසුකම් සපුරා ඇති නිලධරයන් සඳහා රාජ්‍ය භාෂා ප්‍රවීණතා වාචික පරීක්ෂණයට අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

03. මෙයට අදාළ ආදර්ශ අයදුම්පත්‍රය රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ www.languagesdept.gov.lk වෙබ් අඩවියේ පළ කර ඇත. මෙම අයදුම්පත් භාර ගනු ලබන්නේ මාර්ගගත ක්‍රමය ඔස්සේ පමණි. අයදුම්පත් සම්පූර්ණ කිරීමේ දී ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් ඉදිරිපත් කළ හැකි අවසන් දිනය 2023.05.30 දින වේ.

04. විභාග ඉල්ලුම් කරන සෑම නිලධාරියෙකු ම තමා පෙනී සිටින මට්ටම අනුව විභාග ගාස්තු පහත පරිදි ගෙවිය යුතුය.

I මට්ටම - රු. 1000.00
II මට්ටම - රු. 700.00
III මට්ටම - රු. 500.00
IV මට්ටම - රු. 300.00

විභාග ගාස්තුව දිවයිනේ පිහිටි ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින් "රාජගිරිය, ලංකා බැංකුවේ රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්ගේ අංක 7041541 දරන ගිණුමට" බැර කළ යුතු අතර, එම පෝරමයේ තැන්පත්කරුගේ නම සහ ලිපිනය සඳහන් කිරීමට ඇති ස්ථානයේ, නම සහ ලිපිනයට අමතරව විභාග අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය සමග වාචික පරීක්ෂණය - 2023 යන්න ද සඳහන් කළ යුතුය. තව ද විභාගය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කිරීම සඳහා මුදල් ගෙවූ රිසිට්පත ළඟ තබා ගත යුතුය.

05. අයදුම්පත සම්පූර්ණ කිරීමේ උපදෙස්

1) දිස්ත්‍රික්කය - සෞඛ්‍ය හේතූන් මත ලැබෙන අයදුම්පත් ප්‍රමාණය අනුව මෙම වාචික පරීක්ෂණය පළාත් මට්ටමින් සංවිධානය කිරීමට ඉඩ ඇති බැවින් ඔබගේ රාජකාරී ලිපිනය අයත් දිස්ත්‍රික්කය අදාළ කොටුවේ සඳහන් කරන්න.
2) විභාගය සඳහා සපුරා ඇති ලිඛිත සුදුසුකම්, වාචික පරීක්ෂණය සඳහා ඉල්ලුම් කරන භාෂාව හා ඉල්ලුම් කරන මට්ටම නිවැරදිව සඳහන් කළ යුතු අතර, අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු කිසිදු හේතුවක් මත පසුව වෙනස් කරනු නොලැබේ.
3) අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කළ යුතුය.

4) අයදුම්පතෙහි දුරකතන අංකය - මෙම පරීක්ෂණයට සම්බන්ධ ඇතැම් තොරතුරු දුරකතනය මාර්ගයෙන් කෙටි පණිවිඩ හරහා දැනුම් දීමට ඉඩ ඇති බැවින් ඔබ සම්බන්ධ කර ගැනීමට පහසු ජංගම දුරකතන අංකයක් සඳහන් කළ යුතුය.

5) අයදුම්පතෙහි රාජ්‍ය භාෂා ප්‍රවීණතා වාචික පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සපුරා ඇති ලිඛිත සුදුසුකමට අදාළ තොරතුරු සඳහන් කළ යුතුය. එම තොරතුරුවලට අදාළ ප්‍රතිඵල සටහනෙහි පිටපතක් ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු මගින් හෝ සහතික කර විභාගයට පෙනී සිටින අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය.

6) විභාගයට අදාළ මුදල් ගෙවූ ලදුපත වාචික පරීක්ෂණයට පෙනී සිටින අවස්ථාවේ දී ඉදිරිපත් කිරීම අනිවාර්ය ය.

06. ඉහත සඳහන් උපදෙස්වලට සහ ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන්නා වූ හෝ, අසම්පූර්ණ වූ හෝ අවසාන දිනට පසුව ලැබෙන්නා වූ හෝ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත චක්‍රලේඛ ප්‍රකාරව පවත්වනු ලබන අවසාන වාචික පරීක්ෂණය මෙය වන බැවින්, මින් ඉදිරියට වාචික පරීක්ෂණ සඳහා පෙනී සිටීමට කරනු ලබන ඉල්ලීම් ද කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. මෙම පරීක්ෂණය සම්බන්ධයෙන් වන සියලු කරුණු පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් සතු වේ.

08. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළ වන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ප්‍රින්ස් සේනාධීර
රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
නො. 341/7
කෝට්ටේ පාර
රාජගිරිය
2023.02.10